www.AlevelApi.com

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2019

32 - වාණිජ අධ්‍යයනය

පැරණි නිර්දේශය

ලකුණු දීමේ පටිපාටිය

Alevel Api www.alevelapi.com

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

අධ්‍යයනපොදු සහතික පත්‍ර (උසස්පෙළ)විභාගය - 2019 (පැරණි නිර්දේශය)

32 - ව්‍යාපාර අධ්‍යයනය

ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදියාම

අභිමතාර්ථ : ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයෙන් අපේක්ෂිත අභිමතාර්ථ ඉටු වී ඇති අකාරය තක්සේරු කිරීමට හැකිවන පරිදි මෙන්ම විෂය දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණය හා සංස්ලේෂණය හැකියාවන් වඩාත් හොඳින් ඇගයීමට ලක් කිරීමට හැකිවන අයුරින් ප්‍රශ්න හා ගැටළු මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු කර ඇත.

ලකුණු පිරිනමන ආකාරය

ව්‍යාපාර අධ්‍යයනය I.

බහුවරණ 30 යි.	ලකුණු 02 බැගින් -	60
හිස්තැන් පිරවීම 10	ලකුණු 02 බැගින් -	20
නිශ්චිත කෙටි පිළිතුරු 10	ලකුණු 02 බැගින් -	20
		100

ව්‍යාපාර අධ්‍යයනය II.

අ. කොටස - ප්‍රශ්න 04 යි

ආ. කොටස - ප්‍රශ්න 04 යි

එක් කොටසකින් ප්‍රශ්න 02 ක් වත් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු ය.

1 සිට 8 දක්වා ප්‍රශ්න 08 යි. සෑම ප්‍රශ්නයක්ම කොටස් 05 කින් යුක්තවේ.

කොටසකට ලකුණු 04 බැගින් ප්‍රශ්නයකට ලකුණු 20 යි.

මුළු ලකුණු ප්‍රශ්න 05 ට ලකුණු 20 බැගින් - 100

I හා II පත්‍රය සඳහා	-	**200**
අවසාන ලකුණ	-	**100**

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2019

පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்

විෂය අංකය
பாட இலக்கம் 32 පාඨම பாடம் විෂයය வியாபார அධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

I පත්‍රය/பத்திரம் I

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.
01.	1	11.	4	21.	3
02.	5	12.	1	22.	5
03.	2	13.	2	23.	2
04.	3	14.	1	24.	3
05.	4	15.	1	25.	2
06.	4	16.	5	26.	4
07.	2	17.	4	27.	3
08.	3	18.	5	28.	5
09.	4	19.	5	29.	1
10.	1	20.	3	30.	1

විශේෂ උපදෙස්/விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு 02 ලකුණුබැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் $2 \times 30 = 60$

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

31. a) කේවල, භවුල්

b) ලාභ, සුභසාධන

32. a) සඵලදායීතාවය, කාර්යක්ෂමතාවය

b) තීරණ, ව්‍යාවසායක

33. a) ප්‍රසස්ථ, පවත්වාගෙන යාම

b) නිමවුම, ශ්‍රම / සේවක

34. a) ආයෝජන, මූල්‍යයන / මෙහෙයුම් හෝ මුදල් ගලාඒම්, මුදල් ගලායාම්

b) ප්‍රාග්ධන, ලාභාංශ

35. a) වර්තන, ප්‍රාග්ධන

b) විශේෂ, වටිනාකම

36. a) පළමුපෙළ / පහළ, අන්තර්පුද්ගල (මානව)

b) වගකීම, අධිකාරිය

37. a) විකුණුම් / නිමවුම්, පුරස්කාරය

b) අන්තරාල, ප්‍රති

38. a) විචල්‍ය, ස්ථාවර

b) අරමුණු, ක්‍රමෝපායන් / උපක්‍රම

39. a) පවුල්, පෞද්ගලික

b) පිරිවැය, තරඟය

40. a) අණාකර, ණයවර

b) ආරක්ෂාව, අළෙවිකරණය / ප්‍රචාරණය

41. වාසි (Advantages)

- පහසුවෙන් ආරම්භ කල හැකිවීම.
- අයිතිකරුට සියළුම ලාභ හිමිවීම.
- ස්වාධීනව තීරණ ගැනීමට ඇති හැකියාව.
- බල පවත්වන නීති / රෙගුලාසි අවම වීම.
- ව්‍යාපාර තොරතුරුවල රහස්‍ය බව රැකගත හැකිවීම.
- විසුරුවා හැරීම පහසුවීම.
- පාරිභෝගිකයා සමඟ සෘජු සම්බන්ධතා පවත්වා ගත හැකිවීම.
- පාලනයේ පහසුවීම.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

අවාසි (Disadvantages)

- වගකීම අසීමිත වීම.
- අතිරේක ප්‍රාග්ධනය සපයා ගැනීමේදී ගැටළු / දුෂ්කරතා වැඩිවීම.
- තීරණයන්ගේ අසාර්ථක බව ඇතිවීම.
- නෛතික ඒකකයක් නොවීම.
- අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම.
- ව්‍යාපාරය පුළුල්වීමේදී කළමනාකරණ දුෂ්කරතා ඇතිවිය හැකිවීම.
- තනිවම පාඩු දරාගත යුතු වීම.

42. EOQ ආර්ථික ඇනවුම් ප්‍රමාණය

c : එක් ඇණවුමක පිරිවැය

d : එක් වර්ෂයක තොග අවශ්‍යතාව / ඉල්ලුම ප්‍රමාණය

h : එක් ඒකකයක් වර්ෂයක් පවත්වා ගැනීමේ පිරිවැය

43.
- පවුල් පසුබිම
- අධ්‍යාපන පසුබිම
- මූල්‍ය පසුබිම
- සමාජීය පසුබිම
- වෘත්තීමය පසුබිම
- පුද්ගල චරිතය

44.
- රැකියා විශ්ලේෂණය
- අනුස්ථාපනය
- මානව සම්පත් සැලසුම්කරණය
- පුහුණුව / සංවර්ධනය

45.
- ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය
- ඇස්තමේන්තුගත ලාභ අලාභ ප්‍රකාශය
- ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- ණය ආපසු ගෙවීමේ සටහන
- ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය / ශේෂ පත්‍රය

46.
- කොටස් හුවමාරුකරන්නන්
- කොටස් බ්‍රෝකර්වරුන් / කොටස් තැරැව්කරුවන්
- කොටස් නියෝජිතයින්
- ඒකක භාරයන්
- වෙනත් වෙළෙඳපල අතරමැදියන්

www.alevelapi.com

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

BUSINESS STUDIES

A/L 2022

BS

A/L 2018
ලංකාවෙන්ම
70

නව පංති ඇරඹේ.

සක්සස් කලුතර
සෙන: පෙ.ව. 10.30

සියාත්‍රා හොරණ
ඉරිදා 10.30

ඇපෙක්ස් මතුගම
I කණ්ඩායම සදුදා 2.00
II කණ්ඩායම සිකුරාදා 2.00

සිද්ධාන්ත පත්‍ර පරීක්ෂක

ප්‍රියන්ත බණ්ඩාර

B.com(SP), LICA, MAAT, Dip. in. Edu
ජාතික පාසල් ආචාර්ය

විමසීම් 0710921476

47.
- විද්‍යුත් වාණිජ්‍ය කටයුතු සඳහා
- භාණ්ඩ හෝ සේවා ප්‍රචාරණ හැකියාව
- තොරතුරු රැස් කරගැනීමට හැකියාව
- සන්නිවේදන පිරිවැය අවම කරගැනීමට හැකිවීම
- තම වෙළඳපල පුළුල් කරගැනීමට හැකිවීම
- සමාජ ජාලා හරහා තම ව්‍යාපාර කටයුතු කරගැනීමට හැකිවීම
- තම තරඟකරුවන් පිළිබඳව තොරතුරු රැස්කර ගතහැකිවීම

48.
- යතුරු පුවරුව
- මොනිටරය
- මූසිකය
- මුද්‍රන යන්ත්‍රය
- මධ්‍යම සැකසුම් ඒකකය

49.
- දලලාභ අනුපාතය
- ශුද්ධලාභ අනුපාතය
- ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය
- හිමිකම් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය

50.
- බ්ලූටූත් (Blue tooth)
- ක්ෂණික ප්‍රතිචාර කේත(Q R Code)
- විද්‍යුත් තැපෑල(E mail)
- වයිෆයි(Wi - fi)

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

I කොටස

1. (i) (අ) නිෂ්පාදිතයක් සඳහා ඉල්ලුම ඇතිවීම කෙරෙහි බලපාන සාධක **හතරක්** නම් කරන්න.

1. ආදායම / මිලදී ගැනීමේ හැකියාව
2. කැමැත්ත /රුචිය
3. මිලදී ගැනීමේ සූදානම
4. මෝස්තර
5. තරඟකාරිත්වය
6. ප්‍රවර්ධනය
7. ආදේශක හා අනුපූරක භාණ්ඩ මිල

(ලකුණු ½ x 4 = ලකුණු 02,

(ආ) කළමනාකරුවකු තරගකාරී ව්‍යාපාරික ආයතන කෙරෙහි උනන්දු වීමට බලපාන හේතු **දෙකක්** පැහැදිලි කරන්න.

1. ප්‍රවර්ධන ක්‍රම හඳුනා ගැනීමට
2. මිල කිරීමේ ක්‍රම හඳුනාගැනීමට
3. බෙදා හැරීමේ උපාය මාර්ග හඳුනාගැනීමට
4. නිෂ්පාදන උපායමාර්ග හඳුනාගැනීමට
5. යහභාවිතයන් හඳුනාගැනීමට
6. ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කරගැනීමට
7. ව්‍යාපාර පරිසරය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට

(ලකුණු 1 x 2 = ලකුණු 02

(ii) අලුතින් ඉදිකරන ලද විශාල වෙළෙඳ සංකීර්ණයක් මගින් ප්‍රාදේශීය ප්‍රජාව වෙත ලැබිය හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** විස්තර කරන්න.

<u>වාසි</u>

1. භාණ්ඩ හා සේවා ලබාගැනීමට පහසුවීම
2. රැකියා අවස්ථා ඇතිවීම
3. යටිතල පහසුකම් සංවර්ධනය වීම
4. නව ආදයම් මාර්ග බිහිවීම
5. ප්‍රජා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වීම
6. දේපළ මිලගණන් ඉහළ යාම

(වාසි දෙකක් දැක්වීමට ලකුණු ½ x 2 = ලකුණු 0

(විස්තර කිරීමට ලකුණු ½ x 2 = ලකුණු 0

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

අවාසි

1. කුඩා ව්‍යාපාරවලට තර්ජනයක් වීම
2. මාර්ග තදබදය ඇතිවීම
3. පරිසර දූෂණය ඉහළ යාම

(අවාසි දෙකක් දැක්වීමට ලකුණු ½ x 2 = ලකුණු 01)

(විස්තර කිරීමට ලකුණු ½ x 2 = ලකුණු 01)

(iii) ශ්‍රීතමය පදනම මත නිර්මාණය කරන ලද සංවිධාන ව්‍යුහය යනු කුමක් දැයි පැහැදිලි කර, එහි ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** දක්වන්න.

ව්‍යාපාර කාර්යයන් අනුව සංවිධානයේ කටයුතු, සම්පත් හා අධිකාරිය බෙදා හැරීමයි.

උදා - (මෙහෙයුම්, අලෙවි, මූල්‍ය ආදි වශයෙන්)

(ලකුණු 02)

වාසි

1. විශේෂිකරණය ඇතිවීම
2. කාර්යක්ෂමතාවය ඉහළයාම
3. කාර්යයන් පැහැදිලිව හඳුනාගත හැකිවීම / මෙහෙයුම් කටයුතු නිශ්චිත වීම
4. නිෂ්පාදනයේ වර්ධනයක් ඇතිවීම

(ලකුණු ½ x 2 = ලකුණු 01)

අවාසි

1. නිශ්චිත රාමුවකට සීමාවීම
2. අංශ අතර සම්බන්ධීකරණය හා සමායෝජනය අපහසු වීම
3. සහයෝගීතාව හා සාමූහිකත්වය අඩුවීම
4. අංශ අතර ගැටුම් හා මතභේද ඇතිවීම
5. තීරණ ක්‍රියාත්මක කිරීමේ දී පැටලු ඇතිවීම

(ලකුණු ½ x 2 = ලකුණු 01)

(iv) (අ) SWOT (ශ. දු. අ. ත) විශ්ලේෂණය තුළින් ව්‍යාපාරිකයකු හට ලබාගත හැකි වාසි **හතරක්** දක්වන්න.

1. ශක්තීන් අවධාරණය කරගැනීමට
2. දුර්වලතා අවම කරගැනීමට
3. අවස්ථා භාවිතයට ගැනීමට
4. තර්ජන සඳහා පෙර සූදානමක් ඇතිකර ගැනීමට

(ලකුණු ½ x 4 = ලකුණු 02)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ආ) ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් භාවිත කර ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා රජයෙන් බලපත්‍රයක් ලබාගත යුතු ව්‍යාපාර **හතරක්** නම් කරන්න.

1. මැණික්, මිනිරන් වැනි බනිජ සම්පත් ආශ්‍රිත ව්‍යාපාර
2. ගල් [illegible] වැනි සම්පත් ආශ්‍රිත ව්‍යාපාර
3. දැව ආශ්‍රිත ව්‍යාපාර
4. දුර්ලභ පැලෑටි හා ඖෂධ වර්ග ආශ්‍රිත ව්‍යාපාර
5. මුහුදු ආශ්‍රිත අමුද්‍රව්‍ය භාවිත කරන නිෂ්පාදන ව්‍යාපාර

(ලකුණු ½ x 4 = ලකුණු 4

(V) (අ) සමාජ වගකීම් ඉටු කිරීම තුළින් ව්‍යාපාරයක් සඳහා ලැබෙන වාසි **හතරක්** සඳහන් කරන්න.

1. ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම
2. ව්‍යාපාරයේ ප්‍රතිරූපය / කීර්තිනාමය වර්ධනය වීම
3. ව්‍යාපාරය පිළිබඳ විශ්වාසනීයත්වය තහවුරු වීම
4. ගනුදෙනුකරුවන් තෘප්තිමත් කළහැකිවීම
5. ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ කරා ළඟාවීමට පහසුවීම

(ලකුණු ½ x 4 = ලකුණු 2

(ආ) ව්‍යාපාර සංවිධානයක් තම ගනුදෙනුකරුවන් වෙත ඉටු කළ යුතු සමාජ වගකීම් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

1. සාධාරණ වීම - සෑම ගනුදෙනුකරුවෙකුටම සමානව සැලසීම
2. හානි අවම කිරීම - පාරිභෝගිකයාගේ ආරක්ෂාව තහවුරු කිරීම
3. පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම - ජාත්‍යන්තර පාරිභෝගික අයිතිවාසිකම් 8 ආරක්ෂා කිරීමට කටයුතු කිරීම
4. භාණ්ඩ සැපයීම - ගෙවන මුදලට උපරිම තෘප්තියක් ලැබෙන ඉහළ ගුණාත්මයෙන් යුතු භාණ්ඩ සැපයීම
5. පාරිභෝගිකයින්ට දුන් පොරොන්දුව ඉටුකිරීම - නිෂ්පාදන පිළිබඳව ප්‍රවර්ධනයේදී පොරොන්දු වූ පරිදි කටයුතු කිරීම

(කරුණු දැක්වීමට ලකුණු ½ x 2 = ලකුණු 1

(විස්තර කිරීමට ලකුණු ½ x 2 = ලකුණු 1

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

2. (i) (අ) පෞද්ගලික අංශයේ ව්‍යාපාර කටයුතු වර්ධනය කරලීම උදෙසා ශ්‍රී ලංකා රජය මගින් ගනු ලබන ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.

1. ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම
2. බදුසහන සහ බදු විරාම ලබාදීම
3. යටිතල පහසුකම් සංවර්ධනය
4. අලෙවි පහසුකම් ලබාදීම
5. උපකාරක සේවා සැපයීම
6. රාජ්‍ය අංශයේ කාර්යයන් පෞද්ගලික අංශයට ලබාදීම
7. ව්‍යාපාරය සඳහා බලපානු ලබන සීමාවන් නිදහස් කිරීම
8. බලපානු ලබන නීති රීති සරල කිරීම
9. උපදේශන පහසුකම් ලබාදීම
10. තාක්ෂණික පහසුකම් සැපයීම

(ලකුණු ½ x 4 = ලකුණු 02)

(ආ) සෘජු බදු හා වක්‍ර බදු අතර වෙනස්කම් **දෙකක්** සඳහන් කර, එක් එක් බදු වර්ගය සඳහා උදාහරණය බැගින් දක්වන්න.

සෘජුබදු	වක්‍රබදු
1. විතැන් කළ නොහැක	විතැන් කළ හැක
2. ආදායම හා ඉපයුම මත අයකරයි	භාණ්ඩ හා සේවා මත අයකරයි
3. සුදුසුකම් ලබන පුද්ගල කණ්ඩායම් පමණක් ගෙවනු ලබයි	සෑම පුද්ගලයෙකුම ගෙවිය යුතුය
උදා - ආදායම් බදු සමාගම් බදු රඳවා ගැනීමේ බදු ප්‍රාග්ධන ලාභමත බදු	උදා - විකතුකළ ආදායම් බදුVAT තීරු බදු නිෂ්පාදන බදු

(වෙනස්කම් දැක්වීමට ලකුණු ½ x 2 = ලකුණු 01)

(උදාහරණ දැක්වීමට ලකුණු ½ x 2 = ලකුණු 01)

(ii) (අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන වෙත ලබාගත හැකි සේවා **හතරක්** සඳහන් කරන්න.

1. ප්‍රමිති පිරිවිතර ලබාගැනීමට හැකිවීම
2. පරීක්ෂණාගාර පහසුකම්
3. ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිති සහතික ලබාගත හැකිවීම
4. ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු වීම්
5. පුස්තකාල සේවා ලබාගත හැකිවීම
6. පද්ධති සහතිකකරණ සේවා
7. තොරතුරු සේවා

(ලකුණු ½ x 4 = ලකුණු 02)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම උදෙසා භාවිත කරනු ලබන ප්‍රතිපත්ති පොලී අනුපාත වර්ග **දෙකක්** විස්තර කරන්න.

1. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය -

   රජයේ සුරැකුම්පත් ඇපයට තබා (ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනුවල දී) අරමුදල් ලබා ගැනීමේ දී අයකරනු ලබන පොලී අනුපාතිකය

2. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය -

   රජයේ සුරැකුම්පත් වල ආයෝජන කිරීමේ දී (ප්‍රති විකුණුම් ගනුදෙනු වලදී) ගෙවනු ලබන පොලී අනුපාතිකය

3. බැංකු පොලී අනුපාතිකය -

   මහ බැංකුව වාණිජ බැංකුවලට ණය ලබා දීමේ දී (අත්තිකාරම් ප්‍රදානය කිරීමේදී) අයකරන පොලී අනුපාතිකය

4. ව්‍යාවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතිකය -

   වාණිජ බැංකු විසින් තම තැන්පතු සඳහා මහ බැංකුවේ තැන්පතු කළ යුතු සංචිත අවශ්‍යතා

(නම් කිරීමට ලකුණු ½ x 2 = ලකුණු 01)

(විස්තර කිරීමට ලකුණු ½ x 2 = ලකුණු 01)

(iii) අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාරිභෝගික වගකීම් **හතරක්** සඳහන් කර, ඒවා පැහැදිලි කරන්න.

1. විචාරාත්මක දැනුවත්භාවය -

   භාණ්ඩ හා සේවාවන්ගේ තත්ත්වය සහ මිල පිළිබඳ ප්‍රශ්න කිරීම සහ සෝදිසියෙන් සිටීම

2. ක්‍රියා කිරීම / සක්‍රීය සහභාගිත්වය -

   යුක්ති සහගත සහ සාධාරණ ගනුදෙනු සඳහා ක්‍රියාකිරීම පාරිභෝගික අයිතීන් සහ ආධිපත්‍යය තහවුරු කිරීමට ක්‍රියා කිරීම

3. සාමාජීය සැලකිල්ලමත්බව -

   අපගේ පරිභෝජන රටාව අනෙකුත් ජනයා හා කණ්ඩායම් කෙරෙහි ඇතිකරන හානිය පිළිබඳව දැනුවත්වීම

4. පාරිසරික සැලකිල්ලමත් බව -

   වර්තමානයේ දී හා අනාගතයේ දී ස්වභාවික සම්පත් සංරක්ෂණය සහ ආරක්ෂණය තහවුරු කිරීම සඳහා අපගේ පරිභෝජන රටාවන්ගෙන් ඇතිකරන ප්‍රතිඵල පරිසරයට බලපාන ආකාරය පිළිබඳ අවබෝධ කරගැනීම

5. සහයෝගීතාව -

   පාරිභෝගික අයිතීන් හා අවශ්‍යතා ආරක්ෂණය හා ප්‍රවර්ධනයට සහ සාමූහිකව සංවිධානය වීම

(නම් කිරීමට ලකුණු ½ x 4 = ලකුණු 02)

(පැහැදිලි කිරීමට ලකුණු ½ x 4 = ලකුණු 02)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(iv) විධිමත් ව්‍යාපාර සංවිධානයක් අවිධිමත් ව්‍යාපාර සංවිධානයකින් වෙන් කර හඳුනාගත හැකි ලක්ෂණ **හතරක්** විස්තර කරන්න.

1. නිශ්චිත වූ නීති හා රෙගුලාසි පැවතීම
2. වැඩ බෙදාහැරීම හා ඒ පිළිබඳව විශේෂඥතාවයක් පැවතීම
3. පරමාර්ථ හා ප්‍රතිපත්ති නිශ්චිත වීම
4. පුද්ගල කාර්යයන් හි සීමාවක් පැවතීම
5. තොරතුරු ගලා යාම ක්‍රමානුකූල වීම
6. ප්‍රධානියාගේ දැඩි සුපරීක්ෂණය

(කරුණු පැහැදිලි කිරීමට ලකුණු 01 x 4 = ලකුණු 04)

(v) (අ) ශ්‍රී ලංකා රජය ව්‍යාපාර කටයුතුවල නියුක්ත වීම කෙරෙහි බලපාන හේතු **දෙකක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

1. පෞද්ගලික අංශයේ අහිතකර වෙළඳපොළ තත්ත්වය පාලනයට
   උදා - පොදු ප්‍රවාහන කටයුතු, සන්නිවේදන කටයුතු ආදිය
2. වීකාධිකාරී ආයතන බිහිවීම වළකාලීමට
   උදා - රක්ෂණය, මූල්‍ය ආදී ක්ෂේත්‍ර
3. පොදු ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට
   උදා - අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි
4. සම්පත් නාස්තිය අවම කරගැනීමට
   උදා - ජලය, විදුලිය වැනි සේවා
5. ලාභ නොමැති පෞද්ගලික අංශය අත නොගසන වැදගත් මහාපරිමාණ සංවර්ධන යෝජනා ක්‍රම පවත්වාගෙන යාමට
   උදා - ජල විදුලි බලාගාර, ජලාශ යෝජනා ක්‍රම වැනි

(කරුණු 2 ක් උදාහරණ සහිතව දැක්වීමට ලකුණු 02)

(ආ) රාජ්‍ය සංවිධාන පෞද්ගලීකරණය කිරීම තුළින් මහජනතාවට ලැබිය හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න.

වාසි

1. කාර්යක්ෂමතා වර්ධනය
2. නවෝත්පාදන වර්ධනය
3. තරඟකාරිත්වය වර්ධනය
4. දේශපාලන මැදිහත්වීම් අඩුවීම

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

BUSINESS STUDIES

A/L 2022

BS

A/L 2018
ලංකාවෙන්ම
70

නව පංති ඇරඹේ.

සක්සස් කලුතර
සෙන: පෙ.ව. 10.30

සියාත්‍රා හොරණ
ඉරිදා 10.30

ඇපෙක්ස් මතුගම
I කණ්ඩායම සදුදා 2.00
II කණ්ඩායම සිකුරාදා 2.00

සිද්ධාන්ත පත්‍ර පරීක්ෂක

ප්‍රියන්ත බණ්ඩාර

B.com(SP), LICA, MAAT, Dip. in. Edu
ජාතික පාසල් ආචාර්ය

විමසීම් 0710921476

අවාසි

1. **මිල වැඩිවීම**
2. රජයේ පාලනයෙන් බැහැර වීම නිසා සම්පත් නාස්තිය වැඩිවීම
3. රජයේ ආදායම අඩුවීම තුළින් මහජනතාවට ලැබෙන සේවා හා පහසුකම් අඩුවීම
4. සුබසාධන භාණ්ඩ හා සේවා සැපයීම අඩුවීම

(වාසි දෙකට ලකුණු ½ x 2 = ලකුණු 01)

(අවාසි දෙකට ලකුණු ½ x 2 = ලකුණු 01)

3. (i) "ශ්‍රී ලංකාව තුළ කාන්තා ව්‍යවසායකයින් සීමිත ය." කාන්තා ව්‍යවසායකත්ව සහභාගිත්වය වර්ධනය කළහැකි ක්‍රියාමාර්ග **හතරක්** විස්තර කරන්න.

1. කාන්තා ව්‍යවසායකයන් සඳහා මූලික ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම
2. ව්‍යාවසායකත්වය තුළින් ව්‍යාපාරික ලොව ජයගත් කාන්තාවන් පරමාදර්ශී චරිත ලෙස හඳුන්වා දීම
3. කාන්තා ව්‍යාවසායකත්වය පිලිබඳව වූ දැනුම හා ආකල්ප පාසල් අධ්‍යාපනය තුළට ඇතුළත් කිරීම
4. කාන්තා ව්‍යාවසායකත්ව සංවර්ධන ආයතන පිහිටුවීම
5. කාන්තා ව්‍යාවසායකත්ව සංවර්ධන ප්‍රතිපත්ති ඇතිකිරීම
6. සමාජීය ආකල්ප වෙනස් කිරීම
7. පවුලේ වගකීම් ඉටුකිරීමට විකල්ප විසඳුම් හඳුන්වා දීම (උදා - දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැනි)
8. කාන්තා ව්‍යාවසායකයින්ගේ නිෂ්පාදිත සඳහා සුරක්ෂිත වෙළඳපොලක් හඳුන්වා දීම

(ලකුණු 01 x 4 = ලකුණු 04)

(ii) සිරිමලී විසින් තම ප්‍රදේශයේ බහුලව ලබාගත හැකි කෙසෙල් කෙඳි භාවිත කර කාන්තා අත් බෑග්, හිස්වැසුම් හා වෙනත් විසිතුරු නිර්මාණ නිපදවීමේ ආයතනයක් රු. 50 000ක මුදලක් ආයෝජනය කර ආරම්භ කරන ලදි. ඇය විසින් තම ප්‍රදේශයේ රැකියා විරහිත තරුණියන් තිදෙනකුට එම නිෂ්පාදන පිළිබඳ පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව දෛනිකව රු. 800 බැගින් වේතනේ පදනම මත සේවයට බඳවා ගන්නා ලදි. එසේම තම නිෂ්පාදන සංචාරක හෝටල් තුළ අලෙවි කිරීමට ද කටයුතු සිදු කරන ලදී. මෙම සිද්ධිය තුළ ඇති සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ මොනවා දැයි දක්වන්න.

1. දේශීය සම්පත් භාවිතය
2. නව රැකියා අවස්ථා උත්පාදනය
3. නව ආදායම් අවස්ථා බිහිවීම
4. ජනතාවගේ ජීවන මට්ටම ඉහළයාම
5. නව වෙළෙඳපොළවල් සංවර්ධනය වීම
6. නව භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව හිමිවීම

(ලකුණු 01 x 4 = ලකුණු 04)

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(iii) (අ) 'ක්ෂණික ප්‍රතිචාර කේත' (Quick Response Code) භාවිතය මඟින් වාණිජකයකුට ලබාගත හැකි වාසි **දෙකක්** දක්වන්න.

1. පාරිභෝගික විශ්වාසය ඉහළ යාම
2. ආයතනයේ විකුණුම් ප්‍රමාණය වැඩි වී ලාභය ඉහළ යාම
3. භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉක්මණින් ලබාගත හැකිවීම
4. පාරිභෝගිකයාට අන්තර්ජාලය හරහා මෙම කේතය මඟින් සියලු විස්තර ලබාගත හැකි හෙයින් භාණ්ඩය පිළිබඳ ප්‍රවර්ධන වියදම අවම වීම
5. වෙළෙඳ ප්‍රචාරණ ක්‍රමයක් ලෙස යොදාගත හැකිවීම
6. ගනුදෙනු වේගවත් වීම

(ලකුණු 01 x 2 = ලකුණු 02)

(ආ) විද්‍යුත් මුදල් පසුම්බිය (e-wallet) භාවිත කර ජංගම දුරකථනයකින් ගනුදෙනු සඳහා මුදල් ගෙවීමේ දී පුද්ගලයකු විසින් සපුරා තිබිය යුතු මූලික කරුණු **දෙකක්** දක්වන්න.

1. විද්‍යුත් මුදල් පසුබිම් යෙදවුම (E - wallet application) බාගත (download) කරගැනීම
2. පෞද්ගලික තොරතුරු (නම, විද්‍යුත් තැපැල් ලිපිනය, ජංගම දුරකතන අංකය ආදී) ඇතුළත් කිරීම
3. පෞද්ගලික හැඳුනුම් අංකය (Presonal Identification Number (PIN))සකස්කර ගැනීම
4. හරපත හෝ ණයපත විද්‍යුත් මුදල් පසුම්බිය සමග සම්බන්ධ කර ගැනීම

(ලකුණු 01 x 2 = ලකුණු 02)

(iv) (අ) ගනුදෙනුකරුවන් වෙත වාණිජ බැංකු මඟින් ලබාදෙන ණය, කාලය අනුව වර්ග කරන ආකාර **දෙක** උදාහරණ සහිතව විස්තර කරන්න.

1. කෙටිකාලීන බැංකු ණය - වර්ෂයකට වඩා අඩු කාලයක් සඳහා ලබාදෙන බැංකු ණය
2. දිගුකාලීන බැංකු ණය - වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ඇප සුරැකුම් මත ලබා දෙන ව්‍යාපාරික ණය, නිවාස ණය, දේපල ණය වැනි

(ලකුණු 01 x 2 = ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකා ස්වයං රැකියා උත්පාදන ණය යෝජනා ක්‍රමයෙහි (SEPI) අරමුණු කෙටියෙන් පැහැදිලි කරන්න.

1. ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා ණය ලබාදීම
2. පිළිගත් ශ්‍රී ලාංකික වෘත්තීය පුහුණු අධ්‍යාපන ආයතන තුළින් පුහුණුව ලැබූ තරුණයන්ට ස්වයං ව්‍යාපාර ඇරඹීම සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම.

(ලකුණු 01 x 2 = ලකුණු 02)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(v) (අ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කාර්ය **හතරක්** සඳහන් කරන්න.

1. රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම
2. රක්ෂණ බ්‍රෝකර්වරුන් ලියාපදිංචි කිරීම
3. රක්ෂණ සමාගම්වල ලියාපදිංචිය අත්හිටුවීම
4. රක්ෂණ අරමුදල් ආයෝජනය පිළිබඳ කඩඉම් නියම කිරීම
5. රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීම හා සංවර්ධනයට රජයට උපදෙස් දීම

(ලකුණු ½ x 4 = ලකුණු 02)

(ආ) ප්‍රතිරක්ෂණය තුළින් රක්ෂකයාට හා රක්ෂිතයාට ලැබෙන වාසි **දෙක** බැගින් සඳහන් කරන්න.

<u>රක්ෂකයාට</u>

1. දැරීමට සිදුවන අවදානම අවම වීම
2. වන්දි ගෙවීම පහසුවීම
3. වගකීම බෙදී යාම
4. විශාල වටිනාකම් සහිත අවදානම් භාරගත හැකිවීම

(ලකුණු ½ x 2 = ලකුණු 01)

<u>රක්ෂිතයාට</u>

1. රක්ෂණ වාරික මුදල අඩුකර ගතහැකිවීම
2. වන්දි ලැබීම ස්ථීර වීම
3. ඉහළ වටිනාකමක් සහිත වත්කම් පවත්වා ගෙනයාමට හැකිවීම

(ලකුණු ½ x 2 = ලකුණු 01)

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

4. (i) ශ්‍රී ලංකා දුම්රිය ප්‍රවාහන සේවයේ ඇති දුර්වලතා **හතරක්** දක්වා, එක් එක් දුර්වලතාවය මඟහරවා ගැනීමට විසඳුම් යෝජනා කරන්න.

ගැටළුව	යෝජනාව
1. දුම්රිය මාර්ග දිවයින පුරා ව්‍යාප්ත නොවීම.	දුම්රිය මාර්ග ඇති කිරීම හා ව්‍යාප්ත කිරීම.
2. ගමනාන්තය දක්වා යොදාගත නොහැකි නිසා වෙනත් ප්‍රවාහන ක්‍රම යොදාගැනීමට සිදුවීම.	ගමනාන්තය දක්වා යොදාගත හැකිවන සේ අනෙකුත් ප්‍රවාහන මාධ්‍යයක් සමඟ සම්බන්ධ කිරීම.
3. අවශ්‍ය ඕනෑ වේලාවක දී සේවය ලබාගත නොහැකි වීම.	දුම්රිය ධාවනය වන වාරගණන වැඩි කිරීම.
4. විදුලි සංඥා ඇණ හිටීම, දුම්රිය මාර්ග අබලන් වීම, ආදිය නිසා ප්‍රමාද ඇතිවීම.	සංඥා පද්ධති වැඩි දියුණු කිරීම, නව තාක්ෂණික ක්‍රම යොදාගැනීම, දුම්රිය මාර්ග හොඳින් නඩත්තු කිරීම.
5. භාණ්ඩ ප්‍රවාහනයේ දී ඒවාට හානි සිදුවීම.	භාණ්ඩ පැටවීම හා බෑම සඳහා නවීන තාක්ෂණික උපකරණ යොදාගැනීම
6. භාණ්ඩ හා මගීන් ප්‍රවාහනයට අවශ්‍ය පහසුකම් අඩුවීම.	දුම්රිය මැදිරි නවීකරණය කිරීම හා විවිධ භාණ්ඩවලට ගැලපෙන පරිදි දුම්රිය මැදිරි යොදාගැනීම.

(ගැටලු 4 ක් නම් කිරීමට ලකුණු ½ x 4 = ලකුණු 02)
(යෝජනා 4 ක් සඳහන් කිරීමට ලකුණු ½ x 4 = ලකුණු 02)

(ii) (අ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන ආකාර **දෙකක්** සඳහන් කරන්න.

1. වෙළෙඳ ගණුදෙනුවලදී අදාල පාර්ශවයන් අතර අදහස් හුවමාරු කරගැනීම සඳහා.
2. සේව්‍ය සේවක, සේවක සේවක සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා.
3. අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා.
4. මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය සඳහා.
5. ප්‍රාග්ධනය සම්පාදනය කරගැනීම සඳහා.
6. පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා.

(කරුණු 2 ට ලකුණු 1 x 2 = ලකුණු 02)

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ආ) පණිවුඩයක් වාචිකව සන්නිවේදනය කිරීමේ දී එය වෙනස් වීමට බලපාන හේතු **දෙකක්** දක්වන්න.

1. භාෂාව තේරුම් නොගැනීම.
2. අදහස් නිවැරදිව ප්‍රකාශ නොකිරීම.
3. පණිවිඩය නිවැරදිව තේරුම් නොගැනීම.
4. පණිවිඩය ලබන්නා ඒ පිළිබඳ අවධානය යොමු නොකිරීම.
5. ශ්‍රවනයේ දී බාධා සිදුවීම.
6. අදහස් ප්‍රකාශ කිරීමේදී වය වේගවත්ව සිදුකිරීම.
7. විශාල තොරතුරු ප්‍රමාණයක් එකවර ප්‍රකාශ කිරීම.
8. ප්‍රමාණවත් ලෙස තොරතුරු ඉදිරිපත් නොකිරීම.

(කරුණු 2 ට ලකුණු **1 x 2 =** *ලකුණු 02)*

(iii) (අ) විද්‍යුත් සන්නිවේදනය මගින් ව්‍යාපාරිකයකුට හිමිවන වාසි **හතරක්** සඳහන් කරන්න.

1. පිරිවැය අවම වීම.
2. වේගවත් බව.
3. ගෝලීය වශයෙන් පණිවිඩ හුවමාරු කළ හැකිවීම.
4. ලිය කියවිලි භාවිතය අවම කරගත හැකිවීම.
5. පුළුල් පරාසයක තොරතුරු හුවමාරු කරගත හැකිවීම.
6. එකවර විශාල පිරිසකට තොරතුරු සන්නිවේදනය කළ හැකිවීම.
7. ප්‍රතිචාර ක්ෂණිකව ලබාගත හැකිවීම.
8. ප්‍රවර්ධන කටයුතු පහසුවීම.
9. විවිධ ස්වරූපයේ විශාල තොරතුරු ප්‍රමාණයක් ක්ෂණිකව හුවමාරු කරගත හැකිවීම.

(ලකුණු **½ x 4 =** *ලකුණු 02)*

(ආ) දේශීය වෙළෙඳාමේ ප්‍රධාන ප්‍රභේද **දෙක** දක්වා, ඒවා අතර ඇති වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න.

1. සිල්ලර වෙළෙඳාම
2. තොග වෙළෙඳාම

(ලකුණු **½ x 2 =** *ලකුණු 01)*

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

වෙනස්කම්

සිල්ලර වෙළෙඳාම	තොග වෙළෙඳාම
1. අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ විකිණීම සිදුකරයි.	නැවත විකිණීම සඳහා භාණ්ඩ විකිණීම සිදුකරයි.
2. සාපේක්ෂව මිල වැඩිය.	සාපේක්ෂව මිල අඩුය.
3. හුවමාරුවන භාණ්ඩ තොග ප්‍රමාණය අඩුය.	හුවමාරු වන භාණ්ඩ තොග ප්‍රමාණය වැඩිය.
4. තරඟකාරිත්වය වැඩිය.	තරඟකාරිත්වය අඩුය.
5. සීමිත ප්‍රදේශයක ව්‍යාප්තව ඇත.	වෙළෙඳපොල ව්‍යාප්තිය වැඩිය.
6. භාණ්ඩ වර්ග වැඩි ගණනක් විකුණයි.	සීමිත භාණ්ඩ වර්ග පමණක් විකුණයි.
7. සාපේක්ෂව ආයෝජිත ප්‍රාග්ධනය අඩුය.	සාපේක්ෂව ආයෝජිත ප්‍රාග්ධනය වැඩිය.

(ලකුණු ½ x 2 = ලකුණු 01)

(iv) "ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ දී ස්වයං සේවා වෙළෙඳාම ජනප්‍රිය වෙමින් පවතී." මෙම වෙළෙඳාම මගින් වෙළෙන්දන්ට හා පාරිභෝගිකයින්ට අත්වන වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** දක්වන්න.

වෙළෙන්දාට

වාසි

1. සේවකයන් සංඛ්‍යාව අඩුකර ගත හැකිවීම.
2. විවෘතව තබන කාලය තුල වැඩි අලෙවියක් කළ හැකිවීම.
3. පාරිභෝගිකයන් ආකර්ෂණය කරගැනීම පහසුවීම.

(ලකුණු ½ x 2 = ලකුණු 01)

අවාසි

1. විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය වීම.
2. ආරක්ෂණ වියදම් වැඩිවීම.
3. භාණ්ඩ සොරාගැනීම් වැඩිවීම.

(ලකුණු ½ x 2 = ලකුණු 01)

පාරිභෝගිකයාට

වාසි

1. පාරිභෝගිකයාට නිදහස් පරිසරයක තම භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කළ හැකිය.
2. තෝරාගැනීමේ නිදහස.
3. ක්ෂණිකව මිලදී ගැනීම කළ හැකිවීම.

(ලකුණු ½ x 2 = ලකුණු 01)

අවාසි

1. අන්තර් පුද්ගල සම්බන්ධතා අඩුවීම.
2. අනවශ්‍ය දේ මිලදී ගැනීමට පෙළඹීම.
3. නිවෙස් කරා බෙදා හැරීමක් නොමැතිවීම.

(ලකුණු ½ x 2 = ලකුණු 01)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

BUSINESS STUDIES

A/L 2022

BS

A/L 2018
ලංකාවෙන්ම
70

නව පංති ඇරඹේ.

සක්සස් කලුතර
සෙන: පෙ.ව. 10.30

සියාත්‍රා හොරණ
ඉරිදා 10.30

ඇපෙක්ස් මතුගම
I කණ්ඩායම සදුදා 2.00
II කණ්ඩායම සිකුරාදා 2.00

සිද්ධාන්ත පත්‍ර පරීක්ෂක

ප්‍රියන්ත බණ්ඩාර

B.com(SP), LICA, MAAT, Dip. in. Edu
ජාතික පාසල් ආචාර්ය

විමසීම් 0710921476

(v) (අ) විදේශ වෙළෙඳාමේ දී භාවිත වන තීරුබදු නොවන බාධක **දෙකක්** විස්තර කරන්න.

1. ආනයන සීමාකිරීම / පංගු කිරීම - තෝරාගත් භාණ්ඩ ආනයනය සඳහා සීමා පැනවීම.
2. අපනයන සීමාකිරීම / පංගු කිරීම - තෝරාගත් භාණ්ඩ අපනයනය සඳහා සීමා පැනවීම
3. ආනයන අපනයන තහනම් කිරීම - සමහර රටවල් වලට හා සමහර භාණ්ඩ සඳහා අපනයන ආනයන අත්හිටුවීම.
4. වෙළෙඳ ගිවිසුම් - ද්වි පාර්ශ්වික හා බහු පාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් නිසා ආනයන අපනයන සීමාවීම.
5. දැඩි විනිමය ප්‍රතිපත්ති - විදේශ විනිමය ගැටළු පවතින විට විදේශ විනිමය ගණුදෙනු සඳහා දැඩි නීති රීති පැනවීම.

(කරුණු 2 ක් විස්තර කිරීමට ලකුණු 01 x 2 = ලකුණු 02)

(ආ) **ෂානි රක්ෂණ ලිපියක් නිකුත් කිරීමේ අරමුණ පැහැදිලි කරන්න.**

දූෂ්‍ය නෞකාරපතක් නිකුත් කිරීමේ තත්ත්වයක් ඇතිවිටකදී එම භාණ්ඩ තොගයේ අනාගත සියලු අවදානම් අපනයනකරු භාරගන්නා බව සඳහන් කරමින් පාරිශුද්ධ නෞකාර පතක් ලබාගැනීම සඳහා නැවේ කපිතාන් වෙත ඉදිරිපත් කරන ලියවිල්ලයි.

(ලකුණු 02)

II කොටස

5. (i) (අ) තොග පාලනය සඳහා භාවිත කරනු ලබන 'ABC විශ්ලේෂණය' විස්තර කරන්න.

ගබඩාවක ඇති අයිතම ඒවායේ වටිනාකම හා අවශ්‍ය ඉඩකඩ අනුව A, B, C ලෙස වර්ග කර තොග පාලනය කිරීමයි.

A - වටිනාකම වැඩි හා අඩු ඉඩකඩ

B - මධ්‍යස්ථ වටිනාකම හා මධ්‍යස්ථ ඉඩකඩ

C - අඩු වටිනාකම හා වැඩි ඉඩකඩ

(ඉහත පරිදි සම්පූර්ණ පිළිතුරකට ලකුණු 02)

(ආ) භාණ්ඩයක ගුණාත්මය තීරණය කිරීමේ දී නිෂ්පාදකයා හා පාරිභෝගිකයා විසින් සලකා බලනු ලබන සාධක **දෙක** බැගින් කෙටියෙන් විස්තර කරන්න.

<u>නිෂ්පාදකයා</u>

1. පාරිභෝගිකයා රඳවා ගැනීමට හැකිවීම.
2. තම භාණ්ඩය පිළිබඳව පාර්භෝගිකයා තුළ සන්නම් පක්ෂපාතිත්වය ඇතිකිරීම.
3. තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූල වීම.
4. ආයෝජනයට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබීම.
5. ප්‍රමිතියෙන් යුත් අමුද්‍රව්‍ය භාවිත කිරීම.

(ලකුණු ½ x 2 = ලකුණු 01)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

පාරිභෝගිකයා

1. ගෙවනු ලබන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලැබීම.
2. භාණ්ඩය දෝශවලින් තොරවීම.
3. තම කාර්යයට ගැලපෙන බව.
4. කල්පැවැත්ම හා මෝස්තරය.
5. විශ්වාසවන්ත බව.
6. ආරක්ෂිත බව.
7. ප්‍රමිතියට අනුකූලව ගබඩා කරතිබීම.
8. නිෂ්පාදිතය ප්‍රමිතියට අනුකූල බව.

(ලකුණු ½ x 2 = ලකුණු 01)

(ii) රස කැවිලි නිෂ්පාදනය කර බෙදාහරින අම්ලා, තම නිෂ්පාදන සඳහා සුදුසු සන්තමක් නිර්මාණය කිරීමට අදහස් කරයි. මෙහි දී ඇය විසින් සැලකිය යුතු ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

1. කෙටි හා සරල වීම.
2. උච්චාරණය හඳුනාගැනීම හා මතක තබාගැනීම පහසුවීම.
3. නිෂ්පාදනයේ මූලික ගුණාංග, ප්‍රයෝජ්‍යතාව පිළිබඳව අදහසක් ඇඟවීම.
4. පහසුවෙන් වෙනත් භාෂාවකට පරිවර්තනය කළ හැකිවීම.
5. තරඟකරුවන්ගේ සන්නම්වලට වඩා වෙනස් සන්නමක් විය යුතුවීම.
6. කිසියම් සංස්කෘතියක් නියෝජනය කිරීම.
7. සුවිශේෂී වීම.

(ලකුණු 01 x 4 = ලකුණු 04)

(iii) (අ) ප්‍රවර්ධන ක්‍රමයක් ලෙස පෞද්ගලික අලෙවිය වඩාත් උචිතවන අවස්ථා **හතරක්** සඳහන් කරන්න.

1. විශාල වටිනාකමකින් යුත් හා සංකීර්ණ සේවා අවශ්‍යතා ඇති භාණ්ඩ අලෙවියේ දී.
2. පාරිභෝගිකයා සමඟ සෘජු සම්බන්ධතා පවත්වා ගතයුතු භාණ්ඩ අලෙවියේදී.
3. නව භාණ්ඩ අලෙවියේදී.
4. භාණ්ඩයට ඇති ඉල්ලුම අඩු වූ අවස්ථාවලදී.
5. පාරිභෝගිකයාගේ විශේෂ අවධානය භාණ්ඩය සඳහා ලබා ගතයුතු අවස්ථාවලදී.
6. විශේෂ උපදෙස් සැපයිය යුතු භාණ්ඩ අලෙවියේදී.

(ලකුණු ½ x 4 = ලකුණු 02)

(ආ) ශීත කළ ආහාර සඳහා බෙදාහැරීමේ මාර්ගයක් තෝරාගැනීමේ දී සලකා බැලිය යුතු සාධක **හතරක්** සඳහන් කරන්න.

1. වෙළෙඳපොළේ ස්වභාවය.
2. ඉල්ලුමේ ස්වභාවය.
3. තරඟකරුවන්ගේ බෙදාහැරීමේ මාර්ග.
4. නිෂ්පාදකයාගේ ශක්තීන්.

(ලකුණු ½ x 4 = ලකුණු 02)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(iv) මංගත (online) මිලට ගැනුම් ක්‍රමයෙන් පාරිභෝගිකයාට ඇති වාසි දෙකක් හා සීමා දෙකක් විස්තර කරන්න.

වාසි -

1. භාණ්ඩ පෝරාගැනීමට ප්‍රමුල් ඉඩකඩක් පැවතීම.
2. පහසුවෙන් හා ඉක්මනින් ඇණවුම් කළ හැකිවීම.
3. දවසේ පැය 24 පුරාම ගනුදෙනු කළ හැකිවීම.
4. නිෂ්පාදිතයේ මිල මට්ටම සාපේක්ෂව අඩුවීම.

(ලකුණු 01 x 2 = ලකුණු 02)

සීමා -

1. අන්තර්ජාල පහසුකම් සෑම ප්‍රදේශයකම ව්‍යාප්තව නොමැති වීම.
2. භාවිතය පිළිබඳ සෑම පාරිභෝගිකයෙකුම දැනුවත් නොවීම.
3. ගෙවීම් පියවීමේදී විවිධ ගැටලු මතුවීම.
4. බදු අයකිරීම් වැනි නීතිමය සීමාවන්.
5. විද්‍යුත් ක්‍රම පිළිබඳව පාරිභෝගිකයන් තුළ විශ්වාසයක් නොමැතිවීම.
6. පරිගණක පද්ධති ආශ්‍රිතව වංචා හා දූෂණ ඇතිවීම.

(ලකුණු 01 x 2 = ලකුණු 02)

(v) (අ) **මුදල් අයවැය ලේඛනයක් පිළියෙල කිරීම තුළින් ලබාගත හැකි වාසි දෙකක් විස්තර කරන්න.**

1. අනාගතයේ දී මුදල් අතිරික්තයක් වේ නම් එය කල්තබා දැන ගත හැකිවීමෙන් එම මුදල් ඵලදායීව ආයෝජනය කළහැකිවීම.
2. අනාගතයේදී මුදල් ඌණතාවයක් වේනම් එය කල්තබා දැනගෙන ඊට මුහුණ දීමට සූදානම් විය හැකිවීම.
3. ~~සඤ්ඤ~~ මුදල් ක්‍රියාකාරිත්වය හා සැසඳීම මගින් මුදල් පිළිබඳ සැළසුම්කරණය හා පාලනය පහසුවීම.
4. ව්‍යාපාරික ණය ලබාගැනීම, ව්‍යාපාරයේ අනාගත මූල්‍ය තත්ත්වය තහවුරු කිරීම සඳහා ඉවහල් වීම.
5. ඕනෑම අවස්ථාවකදී ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව තොරතුරු ලබා ගතහැකිවීම.

(ලකුණු 01 x 2 = ලකුණු 02)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ආ) "කෙටිකාලීන මූල්‍ය සම්පාදන මාර්ග මගින් ලද අරමුදල් දිගුකාලීන ආයෝජනවල යෙදවීම ව්‍යාපාරයකට අවාසිදායක විය හැකි ය." එසේ වීමට හේතු **දෙකක්** පැහැදිලි කරන්න.

1. කෙටි කාලීන අරමුදල් කෙටි කාලයකින් ආපසු ගෙවිය යුතු වුවද දිගුකාලීන ආයෝජනවලින් ප්‍රතිලාභ ලැබීමට දිගු කාලයක් ගතවීම.
2. දිගුකාලීන ආයෝජන නිසා ව්‍යාපාරයේ ද්‍රවශීලතා ගැටලු ඇතිවීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරිත්වයට බාධා ඇතිවීම.
3. කාරක ප්‍රාග්ධන ඌණතා ඇතිවීමෙන් ආයතනයේ කටයුතු වල කාර්යක්ෂමතාව පහළ යාම.

(ලකුණු 01 x 2 = ලකුණු 02)

6. (i) ගැටලුවකට විසඳුම් ලබාදීමේ දී විවිධ විකල්ප ඇගයීමෙන් පසුව හොඳ ම විකල්පය ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ. ක්‍රියාත්මක කිරීමේ පියවර තුළ ඇතුළත් විය යුතු කාර්ය **හතරක්** පැහැදිලි කරන්න.

- ගැටළුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග අනුව විධාන දීම.
- ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් ලබා ගැනීම.
- විවිධ පුද්ගලයන් අතර සම්පත් කාර්යයන් බෙදාහැරීම.
- අයවැය ලේඛන පිළියෙල කිරීම.

(ඉහත ආකාරයට පැහැදිලි කිරීම් සහිත කරුණකට ලකුණු 01 x 4 = ලකුණු 04)

(ii) පහත දැක්වෙන්නේ සංවිධාන සටහනක කොටසකි.



(අ) 'පාලන අවකාශය' යන්න පැහැදිලි කර, දී ඇති සංවිධාන සටහන අනුව අලෙවි කළමනාකරුගේ පාලන අවකාශයේ තරම දක්වන්න.

- එක් කළමනාකරුවකුට සෘජුව වාර්තා කරනු ලබන සහයකයන් සංඛ්‍යාව පාලන අවකාශය වේ.

(ලකුණු 01)

- පුළුල් පාලන අවකාශයයි.

(ලකුණු 01)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ආ) ඉහත සංවිධානයෙහි දෙපාර්තමේන්තුකරණ පදනම හඳුනාගෙන, එහි වාසි **දෙකක්** දක්වන්න.

ශ්‍රිතමය පදනම

(ලකුණු 01)

වාසි -

- කාර්යය සීමා පථය හඳුනාගත හැකි වීම.
- වගකීම හා වගවීම පහසුවෙන් හඳුනාගත හැකි වීම.
- දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව හා සඵලදායිතාව ඇගයීම පහසුවීම.
- එක් එක් දෙපාර්තමේන්තුවේ කාර්යය සාධනය මැනීමට පහසුවීම.
- සුපරීක්ෂණය පහසුවීම.

(ලකුණු ½ x 2 = ලකුණු 01)

(iii) (අ) මූල්‍යමය නොවන අභිප්‍රේරණ ක්‍රම **හතරක්** නම් කරන්න.

- සේවකයන් පුහුණු කිරීම.
- උසස්වීම් ලබාදීම.
- රැකියා සුරක්ෂිතබව ඇති කිරීම.
- යෝග්‍ය වැඩ පරිසරයක් ලබා දීම.
- නවීන උපකරණ සැපයීම.
- සෞඛ්‍ය, නිවාස, ආහාරපාන, නිල ඇදුම් ලබා දීම.
- කළමනාකරණයට සේවකයන් සම්බන්ධ කරගැනීම.
- විනෝද චාරිකා, විනෝද වැඩසටහන්, ක්‍රීඩා පහසුකම් සංවිධානය කිරීම.
- සේවකයන් ඇගයීම.
- සම්මාන පිරිනැමීම.
- සේවක සවිබල ගැන්වීම.

(කරුණකට ලකුණු ½ x 4 = ලකුණු 02)

(ආ) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය තුළ ඇති හිතකර ලක්ෂණ **දෙකක්** හා අහිතකර ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

හිතකර ලක්ෂණ

- අනුගාමික අදහස් සැළකිල්ලට ගැනීම.
- බලතල විමධ්‍යගත වීමක් දැකිය හැකි වීම.
- සේවක අභිප්‍රේරණයක් සිදුවීම.
- තීරණ ක්‍රියාත්මක කිරීමට සහය නොඅඩුව ලැබීම.
- සියළු පාර්ශවයන්ගේ සාමූහික බැඳීමක් ඇතිවීම.

(කරුණකට ලකුණු ½ x 2 = ලකුණු 01)

අහිතකර ලක්ෂණ

- තීරණ ගැනීම ප්‍රමාද වීම.
- තීරණ ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම
- අභ්‍යන්තර රහස්‍ය තොරතුරු පිටතට යෑම.

(කරුණකට ලකුණු ½ x 2 = ලකුණු 01)

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(iv) (අ) 'සහගාමී පාලනය' සහ 'පසු පෝෂණ පාලනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.

සහගාමී පාලනය

ආයතනයක වැඩකටයුතු සිදුවන අතරතුර වීචලනයන් වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගැනීමයි.

(ලකුණු 01)

පසුපෝෂණ පාලනය

ආයතනයක අපේක්ෂිත කාර්යය හා සත්‍ය කාර්යඵල අතර ඇති වීචලන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමයි.

(ලකුණු 01)

(ආ) ව්‍යාපාර සංවිධානයකට පර්යේෂණය හා සංවර්ධනය වැදගත් වීමට හේතු **හතරක්** සඳහන් කරන්න.

1. නිෂ්පාදිතයේ ගුණාත්වය ඉහළ නැංවීමට.
2. නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩිවීමට.
3. නිෂ්පාදන පිරිවැය අඩුකරගත හැකිවීමට.
4. නව භාණ්ඩ හා සේවා හඳුන්වා දියහැකි වීමට.
5. අපතේ යාම් අවම කිරීමට හෝ ශූන්‍ය කිරීමට.
6. පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවිය හැකිවීමට.
7. නව තාක්ෂණ ක්‍රම භාවිත කළ හැකි වීමට.

(කරුණකට ලකුණු ½ x 4 = ලකුණු 02)

(v) "මෝටර් රථ නිෂ්පාදනයේ දී වැඩි වශයෙන් යොදාගනුයේ ප්‍රවාහ **නිෂ්පාදන** ක්‍රමයයි." මෙම ක්‍රමය මෝටර් රථ නිෂ්පාදනය සඳහා භාවිත කිරීමෙන් ලැබෙන වාසි **හතරක්** පැහැදිලි කරන්න.

1. නිපදවන ඒකක සංඛ්‍යාව වැඩි නිසා ඒකක පිරිවැය අඩුවීම මගින් ආර්ථික පිරිමැසුම් ලබාගත හැකිවීම.
2. අවම සේවක සංඛ්‍යාවක් මගින් නිෂ්පාදන ප්‍රවාහය පාලනය කළ හැකි වීම නිසා සේවක සංඛ්‍යාව අඩුකරගත හැකි වීම.
3. සමස්ථ වෙළෙඳපොල පිළිබඳ අවධානය යොමුකළ හැකි බැවින් වෙළෙඳපොල ව්‍යාප්ත කරගත හැකි වීම.
4. නවීන තාක්ෂණය පහසුවෙන් යොදාගත හැකිවීමෙන් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව වැඩිකරගත හැකි වීම.
5. මහා පරිමාණ නිෂ්පාදනය නිසා වෙළෙඳපොල ඒකාධිකාරයක් නිර්මාණය කිරීම පහසු වීම.
6. තරඟකාරීත්වයට පහසුවෙන් මුහුණදිය හැකි වීම.

(කරුණකට ලකුණු 1 x 4 = ලකුණු 04)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

7. (i) (අ) 'මූලික ප්‍රසිද්ධ නිකුතුවක්' (IPO) යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද?

සමාගමක් පළමුවරට කොටස් නිකුත් කිරීමක් මගින් මහජනයාට දායක වීමට ඇරයුම් කර සමාගම කොටස් වෙළෙඳපලේ ලැයිස්තුගත වීමයි.

(සම්පූර්ණ පිළිතුරකට ලකුණු 02)

(ආ) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය තුළින් ආයෝජකයකු වෙත ලැබෙන වාසි **දෙකක්** විස්තර කරන්න.

- ඉහළ පොලියක් ලැබීම.
- සුරක්ෂිත බව ඉහළ මට්ටමක පැවතීම.
- අවශ්‍යවිට විකුණාගත හැකිවීමෙන් ද්‍රවශීලතාව ඉහළ මට්ටමක පැවතීම.
- වට්ටම් ආයතනයකට ඉදිරිපත්කර ඕනෑම විටක සුරැකුම්පත් වට්ටම්කර මුදල් ලබාගත හැකි වීම.

(ලකුණු 1 x 2 = ලකුණු 02)

(ii) කොළඹ කොටස් හුවමාරුවෙහි ගනුදෙනු වන සුරැකුම්පත් වර්ග **හතරක්** නම් කර, ඒවා කෙටියෙන් විස්තර කරන්න.

1. සාමාන්‍ය කොටස් - නිශ්චිත ලාභාංශයක් හිමිනොවන සමාගමේ හිමිකාරාත්වය ලැබෙන කොටස් වේ.
2. වරණීය කොටස් - නිශ්චිත ලාභාංශ ප්‍රතිශතයක් හිමි සමාගම විසුරුවා හරින අවස්ථාවකදී ප්‍රාග්ධනය ආපසු ගෙවන විට ප්‍රමුඛත්වය හිමිවන කොටස් වේ.
3. කොටස් බලපත්‍ර - අනාගතයේදී නිශ්චිත මිලකට සමාගමක කොටස් මිලදී ගැනීමේ අයිතිය ලබාදෙමින් වර්තමානයේ සමාගම විසින් නිකුත් කරන ලියවිල්ලකි.
4. සාංගමික ණයකර - සමාගමකට ණය ප්‍රාග්ධනය ලබාගැනීම සඳහා නිකුත් කරනු ලබන සුරැකුම්පත් විශේෂයකි.
5. රජයේ සුරැකුම්පත් - රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර.

(විස්තර සහිතව කරුණු 1 ට ලකුණු 1 x 4 = ලකුණු 04)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(iii) (අ) 'සියලු කොටස් මිල දර්ශකය' යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම් සියල්ලේම සාමාන්‍ය කොටස්වල මිල ගණන්හි ඇතිවන උච්චාවචන පෙන්නුම් කරන දර්ශකයයි.

(සම්පූර්ණ පිළිතුරකට ලකුණු 02)

(ආ) 'රැකියා නිර්මාණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි විස්තර කරන්න.

යම් නිශ්චිත අරමුණක් ඉටුකිරීම පිණිස ආයතනයේ වැඩ ඒකකයක් වශයෙන් කළයුතු කාර්යයන්, යුතුකම් හා වගකීම් සකස් කිරීමයි.

(සම්පූර්ණ පිළිතුරකට ලකුණු 02)

(iv) ආයතනයකට අලෙවි සහකරුවන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීමට තීරණය කරන ලදී. මෙසේ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්කරුවන් ආකර්ශනය කර ගැනීමේ ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

වාසි

- වැඩි පිරිසක් අයදුම්කරන නිසා සුදුසුම අයදුම්කරු තෝරාගත හැකිය.
- අඩු පිරිවැයකින් වැඩි පිරිසක් ආකර්ශණය කරගත හැකිය.
- වෙනත් ක්‍රමවලට සාපේක්ෂව පහසු ක්‍රමයක් වීම.
- අයදුම්පත් ආකෘති, සීමාව, අවසාන දිනයන් ආදී විස්තර පුවත්පත් තුලම ඇතුළත් කළහැකි වීම.
- ව්‍යාපාර හැකියාව අනුව දැන්වීමේ නම්‍යශීලීතාවය ඇතිකරගත හැකි වීම.

(ලකුණු 1 x 2 = ලකුණු 02)

අවාසි

- අයදුම්පත් ලැබීමට වැඩිකාලයක් ගතවීම.
- අනවශ්‍ය අයදුම්පත් ලැබීමට ඇති හැකියාව.
- වඩාත් සුදුසු අයදුම්කරුවන් මග හැරීමට ඇති හැකියාව.
- විශාල අයදුම්පත් සංඛ්‍යාවක් ලැබීම නිසා ඒවා අතුරෙන් සුදුසු අයදුම්පත් තෝරාගැනීමට වැඩිකාලයක් හා පිරිවැයක් දැරීමට සිදුවීම.

(ලකුණු 1 x 2 = ලකුණු 02)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(v) (අ) "සම්මුඛ පරීක්ෂණ ක්‍රමය සේවකයින් තෝරාගැනීම සඳහා භාවිත කරන ජනප්‍රිය ක්‍රමයකි." මෙම ක්‍රමයේ ඇති සීමා **දෙකක්** විස්තර කරන්න.

- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පක්ෂපාතී වීම වැනි ඌනතා නිසා යෝග්‍යතම පුද්ගලයන් තෝරාගැනීමට නොහැකි වීම.
- අයදුම්කරු තුළ අනියත බියක් ඇතිවීම.
- අයදුම්කරු මවාගත් ප්‍රතිරූපයක් දැක්වීම / අපේක්ෂකයා ව්‍යාජ ලෙස හැසිරීමට උත්සාහ ගැනීම.
- පිරිවැය අධික වීම.
- වැඩි කාලයක් වැය වීම.

(ලකුණු 1 x 2 = ලකුණු 02)

(ආ) 'සේවක පිරිවැටුම' සමඟ 'සේවක ප්‍රවාසිතාව' යන්න සංසන්දනය කරන්න.

සේවක පිරිවැටුම	සේවක ප්‍රවාසිතාව
• සේවකයින් ආයතනය හැරයාමයි.	• සේවකයන් රාජකාරියට වාර්තා නොකිරීමයි.
• නව සේවකයින් බඳවාගැනීමට අවස්ථාව ලැබේ.	• නව සේවකයින් බඳවා ගැනීමට අවස්ථාව නොලැබේ
• විනය පිළිබඳ ගැටළුවක් නොවේ.	• විනය පිළිබඳ ගැටළුවක් වේ.
• රැකියා හිවිසුම අවසන් වේ.	• රැකියා හිවිසුම අවසන් නොවේ.

(ලකුණු 1 x 2 = ලකුණු 02)

8. (i) සන්නිවේදන තාක්ෂණය විකාශනය වූ ආකාරය ආර්ථික හා සමාජයීය සංවර්ධන යුග අනුව විස්තර කරන්න.

- සංචාරක යුගය - වාචික සන්නිවේදනය සිදුවීම.
- කෘෂිකාර්මික යුගය - අක්ෂර හා සංකේත භාවිතය.
  අතින් හා මුද්‍රණයෙන් ලිඛිතව සන්නිවේදනය සිදුවීම.
- කාර්මික යුගය - විද්‍යුත් ක්‍රම හරහා සන්නිවේදනය සිදුවීම.
- තොරතුරු යුගය - සන්නිවේදන තාක්ෂණය හා තොරතුරු තාක්ෂණය ඒකාබද්ධ වීම.

(ලකුණු 1 x 4 = ලකුණු 04)

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ii) (අ) දත්ත, තොරතුරු හා සංසන්දනය කරන්න.

දත්ත	තොරතුරු
• දත්ත සැකසුම් ක්‍රියාවලියට ආදානය කරන මූලික දෑ දත්ත වේ. • තීරණ ගැනීමට සෘජුවම භාවිත කළ නොහැකිය. • දත්ත, දත්ත වශයෙන් පවතිනතාක් වටිනාකමක් නොමැත. • අමුද්‍රව්‍යයකි / යෙදවුමකි.	• දත්ත සැකසීමේ ක්‍රියාවලියෙන් බිහිවන ප්‍රතිදානය තොරතුරු වේ. • තීරණ ගැනීමට භාවිත කළ හැකිය. • තොරතුරුවල වටිනාකමක් ඇත. • නිමි ද්‍රව්‍යයකි.

(ලකුණු 1 x 2 = ලකුණු 02)

(ආ) 'දැනුම් සේවකයින්' යන්න පැහැදිලි කර, එවැනි සේවකයින් සඳහා උදාහරණ **දෙකක්** සපයන්න.

දැනුම් සේවකයන් යනු ඉහළ අධ්‍යාපන සුදුසුකම් ඇති වෘත්තිකයින්ය.

(ලකුණු 01)

උදා -

- නීතිඥයින්
- ගණකාධිකාරීන්
- විගණකවරුන්
- ඉංජිනේරුවරුන්
- වෙනත් සුදුකර පටි වෘත්තිකයින් (White Coller Jobs)

(ලකුණු ½ x 2 = ලකුණු 01)

(iii) (අ) සංවිධානයක් සඳහා තොරතුරු කළමනාකරණයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

- එක් එක් අංශ ඒකාබද්ධ කිරීමට.
- ප්‍රතිපෝෂණය ලබා දීමට.
- පාරිභෝගික සම්බන්ධතා වර්ධනය කරගැනීමට.
- සේවක සබඳතා වර්ධනය කරගැනීමට.
- නීති බලගැන්වීමට.
- නවෝත්පාදන වර්ධනය කරගැනීමට.

*(ලකුණු **1 x 2** = ලකුණු 02)*

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ආ) ව්‍යාපාරිකයකුට ව්‍යාපාර සැලැස්මක් වැදගත් වීමට හේතු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

1. ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා මඟපෙන්වීමට.
2. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන්ට ව්‍යාපාරය පිළිබඳ අවබෝධයක් ලබාදීමට.
3. ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීමට.
4. ව්‍යාපාරය කරගෙන යාමේදී ඇතිවිය හැකි ගැටළු විසඳාගැනීමට.

(ලකුණු 1 x 2 = ලකුණු 02)

(iv) (අ) අලෙවි සැලැස්මක ඇතුළත් විය යුතු මූලිකාංග විස්තර කරන්න.

- කර්මාන්තය හා වෙළෙඳපොල විශ්ලේෂණය.
- අලෙවි කිරීමට අපේක්ෂිත භාණ්ඩය හා සේවාව.
- ඉලක්ක වෙළෙඳපොල.
- තරඟකාරී විශ්ලේෂනය.
- අපේක්ෂිත අලෙවිය.
- තරඟකරුවන්ගේ අලෙවි උපාය මාර්ග.
- ව්‍යවසායකයාගේ යෝජිත අලෙවි උපාය මාර්ග.
- විකුණුම් පුරෝකථනය.
- අලෙවි වියදම්.

(ලකුණු ½ x 4 = ලකුණු 0

(ආ) තරඟකාරීත්ව විශ්ලේෂණයේ දී අවධානය යොමු කළ යුතු සාධක **හතරක්** ලියන්න.

- පවත්නා තරඟකාරීත්වය.
- තරඟකරුවන් හා ඔවුන්ගේ ශක්තීන්.
- තරඟකාරීත්වයට මුහුණ දීමට සතු ශක්තීන් හා දුර්වලතා.
- වෙළෙඳපොලට පිවිසීමට ඇති බාධා, එනම් පිරිවැය, කාලය, තාක්ෂණය, පවතින පේටන්ට් බලපත්‍ර හා වෙළෙඳ ලකුණ ආදිය.

(ලකුණු ½ x 4 = ලකුණු

(v) ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය තුළ අඩංගු වන 'මෙහෙයුම් පෙර වියදම්' යන්න පැහැදිලි කර, ඒ සඳහා උදාහරණ **දෙකක්** ලියන්න.

මෙහෙයුම් පෙර වියදම් යනු ව්‍යාපාරයක කටයුතු ආරම්භ කිරීමට පෙර අවශ්‍යවන වියදම්

(ලකුණු

උදාහරණ -

ඉඩම් සංවර්ධන.

විදුලිය හා ජල පහසුකම් ලබා ගැනීමට දරන වියදම

බලපත්‍ර ලබාගැනීමට දරන වියදම

(ලකුණු 1 x 2 = ලකුණු

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

BUSINESS STUDIES

A/L 2022

BS

A/L 2018
ලංකාවෙන්ම
70

නව පංති ඇරඹේ.

සක්සස් කලුතර
සෙන: පෙ.ව. 10.30

සියාත්‍රා හොරණ
ඉරිදා 10.30

ඇපෙක්ස් මතුගම
I කණ්ඩායම සදුදා 2.00
II කණ්ඩායම සිකුරාදා 2.00

සිද්ධාන්ත පත්‍ර පරීක්ෂක

ප්‍රියන්ත බණ්ඩාර

B.com(SP), LICA, MAAT, Dip. in. Edu
ජාතික පාසල් ආචාර්ය

විමසීම් 0710921476